SPMC

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

## ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවළුන්, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

**සියලුම අයදුම්කරුවන් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

II. තනතුරට අදාළ රාජකාරී නිසි අයුරින් ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකිවන අයුරින් මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

III. මනා චරිතයකින් යුක්ත විය යුතුය.

## 01. ඖෂධ නිමාකිරීමේ සහායක (PL-2-III ශ්‍රේණිය)

**සුදුසුකම් - බාහිර අපේක්ෂකයින්**

අ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන්, සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන්ට සම්මාන සාමාර්ථ ඇතුළත්ව විෂයයන් 06 කින් සමත්වීම, සහ

ආ) ඖෂධ ඇසිරීමේ කාර්යයෙහි වසර එකක පුහුණුව (NVQ 2 හෝ 3 තලයට සමාන)

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

01. බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

02. SPMC ආයතනයේ ප්‍රාථමික තලයේ - නුපුහුණු සේවකයෙකු වීම හා ඉහත අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් සමග ස්ථිර තනතුරක අඛණ්ඩ, සතුටුදායක වසර පහක (05) සේවා කාලයක්.

**වැටුප් පරිමාණය :** PL-2-2016 : රුපියල් 25,750/- - 10x270 - 10x300 - 10x330 - 12x350 - 38,950/-

- **වයස් සීමාව :**

  අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

  අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- **බඳවාගැනීමේ ක්‍රමවේදය :**

  ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**ආන්තික ප්‍රතිලාභ :**

- පැමිණීමේ හා කාර්යසාධන දිරිදීමනා
- ලබානොගත් වාර්ෂික හා අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම
- වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය හා වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණ යෝජනා ක්‍රමය.
- සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා සංස්ථාව විසින් සේවකයාගේ වැටුපෙන් 15% ප්‍රමාණයකින් දායක වන අතර, සේවකයා විසින් තම වැටුපෙන් 10% ප්‍රමාණයකින් දායක විය යුතුය.
- එසේම සංස්ථාව විසින්, 3% කින් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) දායක වනු ඇත.
- 1983 අංක 12 දරන පාරිතෝෂිත පනත හා MSD චක්‍රලේඛය ප්‍රකාරව පාරිතෝෂිත මුදල් ගෙවනු ලැබේ.
- අනෙකුත් ආන්තික ප්‍රතිලාභද අයත් වේ.

**පොදු කොන්දේසි :**

- නියමිත ආකෘති පත්‍රයෙහි සම්පූර්ණ කළ අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් විස්තර සමග ඉදිරිපත් කළ යුතුය. සියලු අධ්‍යාපනික සුදුසුකම්වල සහතික කළ පිටපත් අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතුය. අදාළ අයදුම්පත, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://www.spmclanka.lk වෙතින් බාගත කළ හැක.
- රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මගින් යොමුකළ යුතු අතර, ඔහු විසින්, මෙම අයදුම්කරු, ඉහත තනතුරුවලට තෝරා ගතහොත් එම පත්වීම ලබාගැනීම සඳහා දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණු සඳහන් කළ යුතුය.
- අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත්, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් මෙම දැන්වීම පළවී දින 10 ක් ඇතුළත ලැබීමට සැලැස්විය යුතුය.
- ඉහත අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති,**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවල වත්ත, රත්මලාන.**